ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

2003 අංක 19 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2003 මැයි මස 9 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2003 මැයි මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 21.50 යි. තැපැල් ගාස්තුව : රු. 6.75 යි.

2003 අංක 19 දරන දේශීය ආදයම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2003 මැයි මස 9 වන දින.]

එල්. ඩී.–ඕ. 11/2003.

2000 අංක 38 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 2003 අංක 19 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 10 දරන පනතින් සංශෝධිත පරිදි වූ 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ 10 වන වගන්තිය, ඒ වගන්තියේ (ඉඉඉ) ඡේදයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:– 2000 අංක 38 දරන පනතේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

> "(ඉඉඉඉ) (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද යම් සුරැකුම් පතක් හෝ භාණ්ඩාගාර බැඳුම්කරයක් පිළිබඳ ද්විතීයික වෙළෙඳපල ගනුදෙනුවක දී හෝ (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පතක් පිළිබඳ ද්විතීයික වෙළෙඳපල ගනුදෙනුවක දී හෝ (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පතක් පිළිබඳ ද්විතීයික වෙළෙඳපල ගනුදෙනුවක දී හෝ 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඒ දිනයෙන් පසුව (යම් සමාගමකට, වෙනත් යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට, හෝ ව්‍යාපාරික ආදායමක් වශයෙන් උද්ගතවන හෝ උපචිතවන පොලිය හැර) යම් තැනැත්තකුට උද්ගතවන හෝ උපචිතවන පොළිය.

මේ ඡේදයේ කාර්ය සඳහා "ද්විතීයික වෙළෙඳ පල ගනුදෙනුව" යන්නට යම් සුරැකුම්පතක් මුලින්ම නිකුත් කරනු ලැබීමෙන් පසුව සුරැකුම්පතක් විකිණීම, ආපසු මිල දී ගැනීම හෝ ප්‍රතිවර්තන වශයෙන් මිල දී ගැනීම ඇතුළත් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. 2001 අංක 8 දරන පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය, ඒ වගන්තියේ (ත) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (ත) (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද සුරැකුම්පතක් හෝ භාණ්ඩාගාර බැඳුම්කරයක් පිළිබඳ ද්විතීයික වෙළෙඳපල ගනුදෙනුවක දී හෝ, (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පතක් පිළිබඳ ද්විතීයික වෙළෙඳපල ගනුදෙනුවක දී හෝ (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පතක් පිළිබඳ ද්විතීයික වෙළෙඳපල ගනුදෙනුවක දී හෝ 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඒ දිනයෙන් පසුව, යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට උද්ගත වන්නා වූ හෝ උපචිත වන්නා වූ, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල ලාභ සහ ආදායම ;

මේ ඡේදයේ කාර්ය සඳහා " ද්විතීයික වෙළෙඳපල ගනුදෙනුව" යන්නට, යම් සුරැකුම්පතක් මුලින් ම නිකුත් කරනු ලැබීමෙන් පසුව, සුරැකුම්පතක් විකිණීම, ආපසු මිල දී ගැනීම හෝ ප්‍රතිවර්තන වශයෙන් මිල දී ගැනීම අදහස් වේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21අ වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ (2002 අංක 10 දරන පනතින් ඇතුළත් කරන ලද) 21අ වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ඒ ව්‍යවසාය විසින් වාණිජ කටයුතු කරගෙන යාම" යන වචනවල සිට "අවුරුදු තුනක කාලයක් සඳහා ආදායම් බද්දෙන්" යන වචන දක්වා ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් –

"එම ව්‍යවසාය ලාභ ලැබීම ආරම්භ කරන තක්සේරු වර්ෂයේ සිට හෝ එම ව්‍යවසාය එහි වාණිජ කටයුතු කරගෙන යාම් ආරම්භ කළ දින සිට ගණන් බලනු ලබන අවුරුදු දෙකකට වඩා පසු නොවන යම් තක්සේරු වර්ෂයක සිට යන මෙයින් කලින් එළඹෙන කාල සීමාවේ සිට ගණන් බලනු ලබන අවුරුදු පහක කාලසීමාවක් ආදායම් බද්දෙන්" ;

(2) ඒ වගන්තියේ (2) උපවගන්තියේ (ආ) ඡේදයේ "රුපියල් මිලියන පන්සියය" යන වචන වෙනුවට "රුපියල් මිලියන දෙසිය පණහ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) (2) වන උපවගන්තියේ (ii) වන අනුඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන්

(ii) "සාම්ප්‍රදායික නොවන නිෂ්පාදන අපනයනය" යන්නෙන්, 49 වන වගන්තියේ අර්ථානුකූලව, අපනයනය සේ සැලකෙන භාණ්ඩ ඇතුළුව 52 වන වගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනුඡේදයේ සඳහන් භාණ්ඩ අපනයනය නොවන, යම් භාණ්ඩ, කවර හෝ තක්සේරු වර්ෂයක් සඳහා ඒ ව්‍යවසායේ සම්පූර්ණ පිරිවැටුමෙන් සියයට අසූවකට නොඅඩුව අපනයනය කිරීම අදහස් වේ.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ (2002 අංක 10 දරන පනතින් ඇතුළත් කරන ලද) 21ආ වගන්තියේ (1) වන උපවගන්තිය එහි "අවුරුදු පහකට නොඅඩු එහෙත් අවුරුදු දහයකට නොවැඩි" යන වචන වල සිට එම උපවගන්තියේ අවසානය දක්වා වූ වචන ඉවත්කොට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 21ආ වගන්තිය සංශෝධනය කිරීම.

"එම සමාගම විසින් එම ව්‍යවසායෙහි කරන ලද ආයෝජනය රුපියල් මිලියන එක් දහසකට අඩු නොවන්නේ නම්, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරන නියමයන් මගින් තීරණය කරනු ලැබිය හැකි, අවුරුදු හයකට නොඅඩු එහෙත් අවුරුදු දොළහකට නොවැඩි කාලයකට, එම ව්‍යවසාය විසින්

ලාභ ඉපයීම ආරම්භ කළ තක්සේරු වර්ෂයේ සිට හෝ එම ව්‍යවසාය වාණිජ කටයුතු කරගෙන යාම ආරම්භ කළ දින සිට අවුරුදු දෙකකට වඩා පසු නොවන යම් තක්සේරු වර්ෂයක සිට යන මෙයින් කලින් එළඹෙන දිනයේ සිට ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 21ඇ, 21ඈ, 21ඉ, 21ඊ සහ 21උ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 21ආ වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, ඒවා ඒ ප්‍රඥප්තියේ 21ඇ, 21ඈ, 21ඉ, 21ඊ සහ 21උ යන වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය :—

"සුළු පරිමාණ යටිතල පහසුකම් ව්‍යවසායයන් ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

"21ඇ. (1) (2) වන උපවගන්තියේ සඳහන් නිශ්චිත ව්‍යවසායකින් යම් සමාගමක් ලබන (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන ලාභ සහ ආදායම් නොවන) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල ලාභ සහ ආදායම, ඒ සමාගම ලාභ ඉපයීම ආරම්භ කළ තක්සේරු වර්ෂයේ සිට හෝ එහි වාණිජ කටයුතු කරගෙන යාම ආරම්භ කළ දින සිට ගණන් බලනු ලබන අවුරුදු දෙකකට වඩා පසු නොවන යම් තක්සේරු වර්ෂයක සිට යන මෙයින් කලින් එළඹෙන දිනයේ සිට අවුරුදු පහක කාලසීමාවකට ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා "නිශ්චිත ව්‍යවසාය යන්නෙන්" 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඒ සමාගම විසින් කරගෙන යන්නා වූ ද විදුලිබල උත්පාදනය, සංචාරක ව්‍යාපාරය, විනෝද ක්‍රීඩා, ගුදම් ගත කිරීම හා ශීත ගබඩා, කුණු කසල එකතු කිරීම හෝ බැහැර කිරීම, නිවාස ඉදිකිරීම හෝ රෝහල් ඉදිකිරීම යන යටිතල පහසුකම් සංවර්ධනයෙහි යෙදී සිටින්නා වූ සහ එම ව්‍යවසාය ආරම්භ කිරීමේ දින සිට එක් අවුරුද්දක් ඇතුළත එහි ආයෝජනය කළ මුළු මුදල් ප්‍රමාණය රුපියල් මිලියන දහයකට නොඅඩු හා රුපියල් මිලියන පණහකට නොවැඩි වන්නා වූ ද ව්‍යවසායක් අදහස් වේ.

පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවල නියුක්ත යම් සමාගමක් ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

21ඇ. පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල යෙදෙන නව ව්‍යවසායක් ආරම්භ කරන්නා වූ සහ ඒ ව්‍යවසාය ආරම්භ කර එක් වර්ෂයක් ඇතුළත රුපියල් මිලියන දෙකකට නොඅඩු මුදලක් එහි ආයෝජනය කරන්නා වූ යම් සමාගමක් 3 වන වගන්තියේ (ඇ) ඡේදයේ අර්ථානුකූලව ලබන (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන ලාභ සහ ආදායම නොවන) ලාභ සහ ආදායම, ඒ ව්‍යවසාය ලාභ ඉපයීම ආරම්භ කරන තක්සේරු වර්ෂයේ සිට හෝ එම ව්‍යවසාය වාණිජ කටයුතු ආරම්භ කරන දින පටන් ගණන් බලන අවුරුදු දෙකකට වඩා පසු නොවූ යම් තක්සේරු වර්ෂයක සිට යන මෙයින් කලින් එළඹෙන දින සිට අවුරුදු පහක කාලයකට ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා "පර්යේෂණ සහ සංවර්ධනය" යන්නෙන්, (නිෂ්පාදනවල තත්ව පාලනය හෝ ද්‍රව්‍ය, උපක්‍රම, නිෂ්පාදන හෝ අස්වනු පිළිබඳ සාමාන්‍ය චර්යානුකූල පරීක්ෂණ හා සමාජ විද්‍යා හෝ මානව ශාස්ත්‍රීය පර්යේෂණ, සාමාන්‍ය චර්යානුකූල දත්ත රැස්කිරීම්, කාර්යක්ෂමතා සමීක්ෂණ, කළමනාකරණ අධ්‍යයන, වෙළෙඳපළ සමීක්ෂණ හෝ අලෙවි ප්‍රවර්ධනය නොවන) පර්යේෂණයෙන් ලැබෙන ප්‍රතිඵලය වන්නේ යම් ද්‍රව්‍ය, උපක්‍රම, නිෂ්පාදන, අස්වනු හෝ ක්‍රියාවලි බිහිකිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා යොදා ගැනීමේ අරමුණු ඇතිව, විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ සිදු කරන යම් ක්‍රමානුකූල හා සූක්ෂම අධ්‍යයනයක් අදහස් වේ.

අක්‍රිය හෝ ඌන ක්‍රියාකාරිත්වයෙන් යුත් ව්‍යාපාර අත්කර ගන්නා යම් සමාගමක් ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

21ඉ. (1) කිසියම් නියමිත ක්‍රියාකාරකම් ක්ෂේත්‍රයක යෙදී සිටින, අක්‍රිය හෝ ඌන ක්‍රියාකාරිත්වයෙන් යුත් ව්‍යාපාර ආයතනයක්, අමාත්‍යවරයා අනුමත කරන නියමයන් මත ඒ ව්‍යාපාර ආයතනය පුනරුත්ථාපනය කිරීම සඳහා අත්කර ගන්නා සහ එම අත්කර ගැනීම කරන අවස්ථාවේ දී ඒ ආයතනයෙන් ගෙවිය යුතුව තිබෙන ව්‍යවස්ථාපිත බැරකම් තේරුම් කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සැලැස්වීමට යටත්ව සිදුකරන යම්

සමාගමක් 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලබන (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබූ ලාභ සහ ආදායම් නොවන) ලාභ සහ ආදායම, 2004 මාර්තු මස 31 වන දින දී හෝ ඊට ප්‍රථම එම අත්කර ගැනීම සම්පූර්ණ කර එහි වාණිජ කටයුතු ආරම්භ කරනු ලැබූ අවස්ථාවක, අවුරුදු තුනක කාලසීමාවකට ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් තුන් අවුරුදු කාලය, එසේ අත්කරගත් ව්‍යාපාර ආයතනය ලාභ ඉපයීම ආරම්භ කරන තක්සේරු වර්ෂයේ සිට හෝ ඒ ව්‍යාපාර ආයතනය වාණිජ කටයුතු ආරම්භ කළ දින සිට ගණන් බැලූ අවුරුදු දෙකකට වඩා පසු නොවූ යම් තක්සේරු වර්ෂයක සිට, යන මෙයින් කලින් එළඹෙන දිනයේ සිට ගණන් බැලිය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා–

"අත්කර ගැනීම" යන්නෙන්, එහි අයිතිකරු බවට, එහි හවුල්කරුවකු බවට හෝ එහි හවුල් ව්‍යවසායකයකු බවට පත්වීමෙන් එම ව්‍යාපාර ආයතනයේ අයිතිය අත්කර ගැනීම අදහස් වේ.

"පුනරුත්ථාපනය" යන්නෙන්, පවත්වාගෙන යා හැකි පදනමක් මත අදාළ ව්‍යවසායේ වාණිජ මෙහෙයුම් කටයුතු නැවත ආරම්භ කිරීම අදහස් වේ.

"නිශ්චිත ක්ෂේත්‍රය" යන්නෙන්, රෙදිපිළි නිෂ්පාදනය, කුකුල් පාලනය, කෘෂි ගොවිපල, මසුන් ඇතිකිරීම හෝ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරන නියමයක් මගින් නිරණය කරන, වෙනත් එවැනි ක්ෂේත්‍රයක් අදහස් වේ.

"අක්‍රිය" යන්නෙන්, වාණිජ මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමට අපොහොසත් වීම අදහස් වේ.

"ඌන ක්‍රියාකාරිත්වය" යන්නෙන් අනුක්‍රමික තක්සේරු වර්ෂ දෙකක කාලයක් තුළ මෙහෙයුම් අලාභ දරන්නට සිදුවීම අදහස් වේ.

අපනයනය සඳහා සාම්ප්‍රදායික නොවන භාණ්ඩ නිෂ්පාදනයේ යෙදී සිටින, එම ව්‍යාපාරය පුළුල් කිරීමට භාරගන්නා යම් සමාගමක් ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

21ඊ. (1) සාම්ප්‍රදායික නොවන භාණ්ඩ නිෂ්පාදනයේ හා අපනයනයේ යෙදී සිටින රුපියල් මිලියන දහයකට නොඅඩු හා රුපියල් මිලියන එක් සියයකට නොවැඩි ආයෝජනයක් මගින් එම භාණ්ඩ නිෂ්පාදන ව්‍යවසාය පුළුල් කිරීමට භාරගන්නා යම් සමාගමක්, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලබන (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබූ ලාභ සහ ආදායම් නොවන) ලාභ සහ ආදායම, එම පුළුල් කිරීම වෙනුවෙන්, 2004 මාර්තු මස 31 දින දී හෝ ඊට ප්‍රථම එකී සම්පූර්ණ ආයෝජන කර තිබෙන අවස්ථාවක අවුරුදු දෙකක කාලයකට ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් අවුරුදු දෙකක කාලසීමාව, එම ව්‍යවසාය පුළුල් කිරීමෙහි යෙදී සිටින සමාගම –

(අ) සාම්ප්‍රදායික නොවන නිෂ්පාදන අපනයනය මත ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබීමට සුදුසුකම් ලබන්නේ නම් ඒ නිදහස් කිරීමේ කාලසීමාව ඉකුත් වීමට නියමිත දිනයේ සිට ; හෝ

(ආ) (අ) ඡේදයේ සඳහන් ව්‍යවසායක් නොවන ව්‍යවසායක් වන විට එම පුළුල් කිරීමෙහි වාණිජ කටයුතු ආරම්භ කළ දින සිට

ගණන් බැලිය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා "සාම්ප්‍රදායික නොවන නිෂ්පාදන අපනයනය" යන්නෙන් 49 වන වගන්තියේ අර්ථානුකූලව භාණ්ඩ අපනයනය සහ අපනයනය සේ සැලකෙන භාණ්ඩ ඇතුළුව 52 වන වගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනුඡේදයේ සඳහන් භාණ්ඩ අපනයනය නොවන, යම් භාණ්ඩ කවර හෝ තක්සේරු වර්ෂයක් සඳහා ඒ ව්‍යවසායේ සම්පූර්ණ පිරිවැටුමෙන් සියයට අසූවකට නොඅඩුව අපනයනය කිරීම අදහස් වේ.

ව්‍යවසායයන් පුළුල් කිරීම මගින් උපයා ඇති ලෙස සැලකිය හැකි ලාභ සහ ආදයම ආදයම් බද්දෙන් නිදහස් කිරීම.

21උ. (1) යම් සමාගමක සාම්ප්‍රදයික අපනයන භාණ්ඩ හෝ අපනයනය කළ නොහැකි භාණ්ඩ නිෂ්පාදනයෙහි යෙදී සිටින ව්‍යවසායක් විසින් එවැනි සාම්ප්‍රදයික අපනයන භාණ්ඩ හෝ අපනයන කළ නොහැකි භාණ්ඩ නිෂ්පාදන ව්‍යවසායක් රුපියල් මිලියන දහයකට නොඅඩු ආයෝජනයක් යොද පුළුල් කිරීම මගින් උපයා ඇති ලෙස සැලකෙන ලාභ සහ ආදායම, එම පුළුල් කිරීම සම්බන්ධ සම්පූර්ණ ආයෝජනය 2004 මාර්තු මස 31 වන දිනට පෙර කර ඇත්නම්, අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා ආදයම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් අවුරුදු දෙකක කාලසීමාව එකී ව්‍යවසාය පුළුල් කිරීමෙන් ලාභ ලැබීම ආරම්භ වූ තක්සේරු වර්ෂය හෝ 2006, අප්‍රේල් මස 1 වන දින යන දෙකෙන් කලින් එළඹෙන අවස්ථාවේ සිට ගණන් බැලිය යුතු ය.

මේ වගන්තියේ කාර්යය සඳහා "යම් ව්‍යවසායක් පුළුල් කිරීම මගින් උපයා ඇති ලෙස සැලකිය හැකි ලාභ සහ ආදයම" යන යෙදුමෙන්, ඒ ව්‍යවසාය ආදයම් බද්දෙන් නිදහස් කරනු ලබන කාලසීමාව ආරම්භ වීමට පෙරාතුවම අවුරුදු තුනක කාලසීමාවේ සම්පූර්ණ ලාභය සැලකිල්ලට ගෙන ගණනය කරනු ලබන වාර්ෂික ලාභයේ සාමාන්‍යය වන, ඒ ව්‍යවසායේ වාර්ෂික ලාභයේ සාමාන්‍යය ඉක්මවන, ලාභය ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබීමට එම ව්‍යවසාය සුදුසුකම් ලබනුයේ යම් තක්සේරු වර්ෂයක ද, එම වර්ෂයට ඒ ව්‍යවසාය විසින්, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් උපයාගත් ලාභ හා ආදයම නොවන) සාම්ප්‍රදයික අපනයන භාණ්ඩ හෝ අපනයනය කළ නොහැකි භාණ්ඩ නිෂ්පාදනයෙන් ඉපයූ ලාභ හා ආදයම් අතිරික්තය අදහස් වේ."

7. 2002 අංක 10 දරන පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ (iii) වන අනුඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"(iii) ඒ තැනැත්තා විසින් අත්කරගෙන, යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් සඳහා ඒ වෙළෙඳාමේ, ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රක්ෂාවේ යොදවා සිටින සේවා නියුක්තයන් ඔවුන්ගේ සේවා ස්ථානය දක්වා හෝ සේවා ස්ථානයේ සිට ප්‍රවාහනය කිරීම සඳහා පාවිච්චි කරන මෝටර් කෝච් රථයක් වෙනුවෙන්, ඒ මෝටර් කෝච් රථය අත්කර ගැනීමේ පිරිවැයෙන් සියයට සියයක් බැගින් ;"; සහ

(2) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ (ii) වන අනුඡේදය ඉවත් කර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ii) 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව යම් තක්සේරු වර්ෂයක් සඳහා කරන ලද ගෙවීමකින් හතරෙන් එකකට සමාන මුදල් ප්‍රමාණයක් ;".

8. 2002 අංක 10 දරන පනතින් අවසන් වරට සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඒ) ඡේදයේ "96 වන වගන්තිය" යන වචන හා ඉලක්කම් වෙනුවට "95 වන වගන්තිය" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. 2002 අංක 10 දරන පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි වැඩිදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1අ) උපවගන්තියේ-

(අ) "122අ වගන්තිය යටතේ" හෝ "122 අ වන වගන්තියේ" යන වචන හා ඉලක්කම් යෙදෙන සෑම තැනකම ඒ වෙනුවට "122අ වගන්තිය හා 122ආ වගන්තිය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ අතුරු විධානයේ "ආදායමේ කොටසක් විය යුතු ය ;" යන වචන වෙනුවට "ආදායමේ කොටසක් විය යුතුය :" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ උපවගන්තියේ අතුරු විධානයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"එසේම තවදුරටත්, (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ වූ යම් සුරැකුම්පතක් හෝ භාණ්ඩාගාර බැඳුම්කරයක් මත හෝ (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පතක් හෝ (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පතක් පිළිබඳ යම් ප්‍රාථමික වෙළෙඳපල ගනුදෙනුවක දී 122අ වගන්තිය යටතේ බදු අයකරගෙන තිබෙන, සමාගමක් වන හෝ අන්‍යාකාර වූ ප්‍රාථමික අලෙවිකරුවකුට එම ගණුදෙනුව ලැබුණු හෝ උපචිත පොලිය, අදාළ තැනැත්තාගේ ව්‍යවස්ථාපිත ආදායම ගණනය කිරීමේ කාර්යය සඳහා 3 වන වගන්තිය යටතේ යම් වෙළෙඳාමකින් හෝ ව්‍යාපාරයකින් වූ ලැබීම් ලෙස නොසැලකිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (1අ) උපවගන්තියට ඉක්බිතිව ම, මෙහි පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1ආ) 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, යම් ප්‍රාථමික අලෙවිකරුවකුගේ තක්සේරු කළ

හැකි ආදායමට ඔහු ලබා ඇති හෝ ඔහුට උපචිත වී ඇති පොලී ආදායම-

(අ) අවස්ථාවෝචිත පරිදි 122අ වගන්තිය හෝ 122ආ වගන්තිය යටතේ, එම මුළු පොලී මුදලෙන් බදු අයකරගෙන ඇති අවස්ථාවක ; සහ

(ආ) එම පොලී ආදායම, අවස්ථාවෝචිත පරිදි, 122අ වගන්තියේ හෝ 122ආ වගන්තියේ සඳහන් (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ හෝ (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ හෝ (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද සුරැකුම්පත් හෝ භාණ්ඩාගාර බැඳුම්කර හා සම්බන්ධ ප්‍රාථමික වෙළෙඳපල ගනුදෙනුවක් වෙනුවෙන් ඒ ප්‍රාථමික අලෙවිකරුට උපචිත වී හෝ උද්ගත වී ඇති අවස්ථාවක,

ඇතුළත් නොවිය යුතු ය." ; සහ

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ අතුරු විධානයේ-

(අ) (iii) වන ඡේදයේ (ඇ) අනුඡේදයේ "වටිනාකමක් ගෙවනු ලබන්නේ නම්," යන වචන වෙනුවට "වටිනාකමක් ගෙවනු ලබන්නේ නම්" යන වචන ආදේශ කිරීමෙන්,

(ආ) (iii) වන ඡේදයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්-

"(iv) ගෙවිය යුතු මුදල, ඒ වන විට 2002 අප්‍රේල් මස 1 වන දිනට පූර්වයෙන් ආරම්භවන තක්සේරු වර්ෂයක දී ඉඩහැර ඇත්නම්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 40ආ වගන්තිය සංශෝධනය කිරීම.

10. 2002 අංක 10 දරන පනත මගින් ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කරන ලද 40ආ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "21 ආ වගන්තිය" වචන හා ඉලක්කම් වෙනුවට,"21ආ වගන්තිය හෝ 21ඈ වගන්තිය" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "21අ වගන්තිය" යන වචන හා ඉලක්කම් වෙනුවට "21අ වගන්තිය හෝ 21ඈ වගන්තිය" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "(කපාපු පොල් නොවන)" යන වචන වෙනුවට "(පොල්තෙල් සහ කපාපු පොල් නොවන)" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය, එහි "(කපාපු පොල් නොවන)" යන වචන යෙදෙන සෑම තැනකම ඒ වෙනුවට "(පොල්තෙල් සහ කපාපු පොල් නොවන)" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තිය සංශෝධනය කිරීම.

13. 2002 අංක 10 දරන පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තිය, එහි (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(2) සෑම බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් හෝ යම් ණය පුරුකුමක් නිකුත් කරන සමාගමක් සෑම තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට ගෙවන හෝ බැර කරන හෝ බැර කරන ලද සේ සැලකෙන යම් පොලියකින්, පිළිවෙලින් 122අ වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ හෝ 122ආ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව, ආදායම් බදු අඩුකරන, අවස්ථාවක-

(අ) ගෙවන ලද හෝ බැර කරන ලද හෝ බැර කරන ලද සේ සැලකෙන, පොලියේ දළ මුදල් ප්‍රමාණය ;

(ආ) අඩුකර ගන්නා ලද බදු මුදල් ප්‍රමාණය සහ අදාළ බදු අනුප්‍රමාණය ;

(ඇ) ඇත්ත වශයෙන් ගෙවන ලද ශුද්ධ පොලී මුදල යන විස්තර දැක්වෙන ප්‍රකාශයක්, ඒ තැනැත්තා වෙත හෝ හවුල් ව්‍යාපාරය වෙත නිකුත් කළ යුතු ය.".

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 122අ වගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 122අ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"බැංකු හෝ මූල්‍ය ආයතන විසින් ගෙවන පොලිය මත ආදායම් බදු අඩුකර ගත යුතු බව.

122අ. (1) සෑම බැංකුවක්ම හෝ මූල්‍ය ආයතනයක් ම ඒ බැංකුවේ හෝ මූල්‍ය ආයතනයේ,-

(අ) යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ඔහුගේ හෝ එහි නාමයෙන් හෝ වෙනත් තැනැත්තකුගේ නාමයෙන් නැතහොත් යම් තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයක නමක් නොමැතිව හෝ, (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හෝ සුරැකුම්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද යම් සුරැකුම්පතක් හෝ භාණ්ඩාගාර බැඳුම්කරයක් නැතහොත් (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පතක් නැතහොත් (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද මහ බැංකු සුරැකුම්පතක් හැර, ඒ බැංකුවේ හෝ මූල්‍ය ආයතනයේ තැන්පත් කරන ලද යම් මුදලක් සඳහා, ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් පොලිය ගෙවන අවස්ථාවේ දී-

(i) 2002 අප්‍රේල් මස 1 වන දින හෝ එයට පසුව හා 2003 ජනවාරි මස 1 වන දිනට පෙර ඒ තැන්පතුව සඳහා ගෙවිය යුතු හෝ බැර කළ යුතු පොලිය මසකට රුපියල් හය දහසකට අඩු නොවන හෝ මාස දොලහක කාලසීමාවක් සඳහා

රුපියල් හැත්තෑ දෙදහසකට හෝ අඩු නොවන අවස්ථාවක, 2002 අප්‍රේල් මස 1 වන දිනට හෝ

(ii) 2003 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ඒ තැන්පතුව සඳහා ගෙවිය යුතු හෝ බැර කළ යුතු පොලිය මසකට රුපියල් නව දහසකට අඩු නොවන හෝ මාස දොළහක කාලසීමාවක් සඳහා රුපියල් එක් ලක්ෂ අට දහසකට වඩා අඩු නොවන අවස්ථාවක,

ඒ තැන්පතුව මත ගෙවනු ලබන හෝ බැර කරනු ලබන මුළු පොලී මුදල් ප්‍රමාණයෙන් සියයට දහයේ අනු ප්‍රමාණය අනුව මේ පරිච්ඡේදයේ විධිවිධානවලට යටත්ව ආදායම් බදු අඩුකර ගත යුතු ය :

එසේ වුවද පුණ්‍ය ආයතනයක් ලෙසට කොමසාරිස් ජනරාල්වරයා විසින් සහතික කරන ලද ආයතනයක් සම්බන්ධයෙන් වන විට ඒ ආයතනය විසින් දරනු ලබන සියලු තැන්පතු හෝ ගිණුම් මත ඒ ආයතනයට ගෙවනු ලබන හෝ බැර කරනු ලබන මසකට රුපියල් දොළොස් දහසක් හෝ වර්ෂයකට රුපියල් එක් ලක්ෂ හතලිස් හතර දහසක් නොඉක්මවන යම් පොලියකට සහ වට්ටමකට මේ ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය :

එසේම තවදුරටත් යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් යම් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක තැන්පත් කරන ලද මුදල් ප්‍රමාණයක් මත ඒ තැනැත්තාට හෝ හවුල් ව්‍යාපාරයට ගෙවිය යුතු හෝ බැර කළ යුතු යම් පොලී මුදලකින් වර්ෂයකට සියයකට දහයක අනුප්‍රමාණය මත ආදායම් බදු අඩුකරන ලෙස යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් බැංකුවකින්, මූල්‍ය ආයතනයකින් ලියවිල්ලක් මගින් ඉල්ලා සිටිනු ලැබූ අවස්ථාවක, ගෙවනු ලබන හෝ බැර කරනු

ලබන පොලිය සහ වට්ටම මීට ඉහතින් ඇති විධිවිධානවල නිශ්චිතව නියම කර තිබෙන මුදල් ප්‍රමාණයන් නොඉක්මවුවද ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය ඒ ඉල්ලීම ඉටු කළ යුතු අතර, එම බදු මුදල් අඩු කර ගැනීම 122අ වගන්තිය යටතේ අඩුකර ගැනීමක් විය යුතු ය.

(ආ) යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින්, ඔහුගේ හෝ එහි නාමයෙන් හෝ වෙනත් තැනැත්තකුගේ නාමයෙන් නැතහොත් යම් තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයක නමක් නොමැතිව (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හෝ සුරැකුම්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද යම් සුරැකුම්පතක හෝ භාණ්ඩාගාර බැඳුම්කරයක නැතහොත් (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පතක, නැතහොත් (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද ශ්‍රී ලංකා මහා බැංකු සුරැකුම්පතක ඒ බැංකුවේ හෝ මූල්‍ය ආයතනයේ තැන්පත් කරන ලද යම් මුදලක් සඳහා, ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් ඒ සුරැකුම්පතෙහි හෝ බැඳුම්කරයේ හෝ බිල්පත්‍රයේ කාලසීමා තුළ යම් වට්ටමක් දෙන සහ යම් පොලියක් ගෙවන හෝ ගෙවිය යුතු වන අවස්ථාවේ දී—

අවස්ථාවෝචිත පරිදි ඒ සුරැකුම්පත, බැඳුම්කරය හෝ බිල්පත නිකුත් කළ වේලාවේ දී සුරැකුම්පතෙහි, බැඳුම්කරයෙහි හෝ බිල් පත්‍රයෙහි භාවය ප්‍රකාර එහි කාලය තුළ කල්පිරීම දක්වා ලැබෙන ප්‍රතිලාභය අනුව ගණන් බලනු ලබන මුළු පොලී මුදල මත සියයට දහයක අනුප්‍රමාණය අනුව ගණන් බලන ලද ආදායම් බදු. 2002 අප්‍රේල් 01 දිනට පෙර නිකුත් කරන ලද යම් සුරැකුම්පතක්, බැඳුම්කරයක් හෝ බිල්පත්‍රයක් සම්බන්ධයෙන් හැර, මේ පරිච්ඡේදයේ විධිවිධානවලට යටත්ව, අඩුකර ගත යුතු ය.

මේ ඡේදයේ කාර්ය සඳහා, "(420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද යම් සුරැකුම්පතක හෝ භාණ්ඩාගාර බැඳුම්කරයක හෝ (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද යම් භාණ්ඩාගාර බිල්පතක් නිකුත් කරන අවස්ථාවේ දී එහි කල්පිරීම දක්වා ප්‍රතිලාභය" යන්නෙන් ඒ සුරැකුම්පතෙහි, බැඳුම්කරයෙහි හෝ බිල්පත්‍රයෙහි සම මිල මත අධි මිලක් හෝ වට්ටම් සහිත මිලක් විය හැකි එය නිකුත් කිරීමේ මිල, පොලී කූපන්පත්, පොලී කූපන්පත් නිකුත් කිරීමේ අන්තර කාලය සහ අවධිය, කල්පිරීමේ දී අගය සහ කල්පිරීමේ කාලසීමාව සැලකිල්ලට ගන්නා විට එය නිකුත් කරන වේලාවේ දී පොලිය අදහස් වේ.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන එසේම තිබුණ ද, යම් ඉතිරිකිරීමේ සහතිකයක්, තැන්පතු සහතිකයක්, හෝ ඒ සමාන සාධන පත්‍රයක් හෝ ආණ්ඩුවේ රුපියල් ණය, හෝ යම් පුද්ගලයකුගේ නමින් හෝ වෙනත් යම් පුද්ගලයකු සමඟ හවුලේ නොමැති තැන්පතුවක් හෝ කොමසාරිස් ජනරාල්වරයා සහතික කළ යම් පුණ්‍ය ආයතනයක තැන්පතුවක් නොවන විට, දෙන ලද වට්ටමේ මුළු මුදල සහ මුළු පොලී මුදල් ප්‍රමාණය කුමක් වුවද එම මුළු වට්ටම හා පොලිය මත ආදායම් බදු අඩු කරගත යුතු ය.

(3) මේ වගන්තිය යටතේ බදු අඩුකර ගැනීමේ කාර්යය සඳහා-

(අ) තැන්පත් කළ මුදල් ප්‍රමාණයක් යන්නෙන්, පොලී ලැබෙන යම් තැන්පතුවක්, කවර හෝ ආකාරයක ඉතිරි කිරීමේ සහතිකයක් හෝ තැන්පතු සහතිකයක් හෝ (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද යම් සුරැකුම්පතක් හෝ භාණ්ඩාගාර බැඳුම්කරයක් හෝ (417

වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පතක් හෝ (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පතක් අදහස් වේ ;

(ආ) යම් මුදල් ප්‍රමාණයක් තැන්පත් කිරීම හා සම්බන්ධව "පොලිය" යන්නට පොලියක්, වට්ටමක් හෝ සහතික වී ඇති ආදායමක් හෝ සහතික වී ඇති ගාස්තුවක් හෝ යම් මුදලක් තැන්පත් කර ඇත්තේ යම් තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයක නමින් ද නැතහොත් යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන් ද ඒ තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරයේ ප්‍රතිලාභය පිණිස උපචිත වන වෙනත් යම් ගෙවීමක් හෝ යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරය වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකුගේ ප්‍රතිලාභය පිණිස උපචිත වන යම් ගෙවීමක් ඇතුළත් වන නමුත්, 10 වන වගන්තිය යටතේ නිදහස් කරන ලද පොලියක් හෝ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකුගේ යම් අමාත්‍යාංශයකට හෝ ශ්‍රී ලංකා ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවකට හෝ යම් පළාත් පාලන ආයතනයකට හෝ පළාත් සභාවක් යටතේ තිබෙන යම් ආයතනයකට හෝ යම් විදේශීය ආණ්ඩුවකට හෝ මේ පනතේ 8(අ) වගන්තිය යටතේ එවැනි පොලී සම්බන්ධයෙන් නිදහස් කරනු ලැබ තිබෙන සවර හෝ තැනැත්තකුට බැර කරන ලද හෝ ගෙවන ලද පොලියක් ඊට ඇතුළත් නොවේ.

(ඇ) ඉඩදෙන ලද වට්ටමක් සම්බන්ධයෙන් වන විට, එම වට්ටමේ මුදල් ප්‍රමාණයට සමාන පොලිය එම වට්ටමට ඉඩ දෙනු ලැබූ අවස්ථාවේ දී ගෙවනු ලැබූ ලෙස සැලකිය යුතු අතර, පොලී සහිත බිල්පත්‍රයක් හෝ බැඳුම්කරයක් හෝ සුරැකුම්පතක් වලංගුව

පවතින කාලසීමාව ඇතුළත ඒ බිල්පත්‍රය, බැඳුම්කරය හෝ සුරැකුම්පත පොලී ගෙවීම් සහිත වන්නේ නම් එම පොලිය, ඒ බිල්පත්‍රය, බැඳුම්කරය හෝ සුරැකුම්පත කල් පිරෙන තෙක් ඉන් ලැබෙන පොලිය වන අතර, ඒ බිල්පත්‍රය, බැඳුම්කරය හෝ සුරැකුම්පත නිකුත් කරන අවස්ථාවේ දී ඒ පොලී මුදල ගෙවන ලද සේ සැලකිය යුතු ය.

මෙහි (1) වන උපවගන්තියේ "පොලිය ගෙවන හෝ බැරකරන අවස්ථාවේ දී අඩුකරගත යුතු ය" යන යෙදුමට, තැන්පත්කරුගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ යම් ගිණුමකට බැර කරන ලද යම් පොලී මුදල් ප්‍රමාණයක් ඇතුළත් වන බව, සැක දුරු කිරීම පිණිස මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 122ආ යන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

15. මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය, ප්‍රධාන ප්‍රඥප්තියේ 122අ වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 122ආ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

"සංස්ථා ණය සුරැකුම්පත් නිකුත් කරන සමාගමක් විසින් පොලිය මත ආදායම් බදු අඩුකරගත යුතු බව.

122ආ. (1) සංස්ථා ණය සුරැකුම් නිකුත් කරන කවර හෝ සමාගමක් විසින්, එම ණය සුරැකුම්පත් සඳහා යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් 2002 නොවැම්බර් මස 1 වන දිනට පෙර හෝ ඉන් පසුව දායක වන යම් මුදල් ප්‍රමාණයක් වෙනුවෙන් පොලී ගෙවන අවස්ථාවේ දී, ඒ ගෙවීම 2002 නොවැම්බර් මස 1 වන දින හෝ ඊට පසුව සිදුවන්නේ නම්, ඒ ණය සුරැකුම්පත මත උපචිත වූ සහ ගෙවනු ලබන හෝ බැර කරනු ලබන මුළු පොලී මුදලෙන්, මේ පරිච්ඡේදයේ විධිවිධානවලට යටත්ව, සියයට දහයේ අනුප්‍රමාණය මත ආදායම් බදු අඩු කර ගත යුතු ය :

එසේ වුවද සම මිලෙන් සියයට පනහක් ඉක්මවන වට්ටමක් සහිතව නිකුත් කරන ලද සංස්ථා ණය සුරැකුම්පතක් මේ වගන්තිය යටතේ බදු අඩුකර ගැනීමකට යටත් නොවිය යුතු ය. මේ පනතේ

පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද එබඳු සුරැකුම්පතක් පිළිබඳ ද්විතීයික වෙළෙඳපල ගනුදෙනුවක් ද ඇතුළුව එබඳු සුරැකුම්පතකින් හෝ සුරැකුම්පතක් හා සම්බන්ධව උද්ගත වන යම් පොලියකින් හෝ වෙනත් ආදායමකින් හෝ සියයට දහයේ අනුප්‍රමාණය අනුව බදු අයකරනු ලැබිය හැකි ය.

(2) 2002 නොවැම්බර් මස 1 වන දින හෝ ඉන් පසුව එවැනි ණය සුරැකුම්පතක් මත යම් වට්ටමකට ඉඩදෙනු ලැබූ හෝ වෙනත් යම් සහතික වූ ආදායමක් ගෙවනු ලැබූ අවස්ථාවක, ඒ වට්ටම හෝ ආදායම, ගෙවනු ලැබූ පොලියක් ලෙස සැලකිය යුතු අතර ඒ අනුව ආදායම් බදු අඩුකර ගනු ලැබීමට යටත් විය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා,

(අ) ''සංස්ථා ණය සුරැකුම්පත'' යන්නෙන්,

(i) ව්‍යාපාරවස්තු විනිමය ස්ථානයේ ලැයිස්තුගත, සීමිත වගකීම් සහිත සමාගමක් වන සමාගමක් විසින් නිකුත් කරන ලද්දා වූ ද ; හෝ

(ii) සුරැකුම්පත ව්‍යාපාරවස්තු විනිමය ස්ථානයේ ලැයිස්තුගතකර ඇත්තා වූ ද ; හෝ

(iii) සුරැකුම්පත සඳහා මුදල් ගෙවන අනුයෝජිතයා–

(අ) බලපත්‍රලත් වාණිජ බැංකුවක් හෝ ඒ බැංකුවක මූල්‍ය සේවාවල නිරත පාලිත සමාගමක් ; හෝ

(ආ) බලපත්‍රලත් විශේෂිත බැංකුවක් හෝ ඒ බැංකුවක මූල්‍ය සේවාවල නිරත පාලිත සමාගමක් ; හෝ

(ඇ) බැංකුවක් නොවන මූල්‍ය ආයතනයක් වන්නා වූ ද,

යම් පුරුකුම්පතක් අදහස් වන අතර,

එම සාධන පත්‍රය, ඉල්ලා සිටි විටක හෝ එම පුරුකුම්පත බල සහිතව පවත්නා කාලය ඇතුළත හෝ එහි කල් පිරීමේ දී හෝ නිශ්චිත මුදල් ප්‍රමාණයක්, එය දරන්නාට ගෙවීමේ බැඳීමක් එම පුරුකුම්පත නිකුත් කළ සමාගම කෙරෙහි ඇතිකරවන, හා බැඳුම්කර, නෝට්ටු, උකස් සහ වෙනත් කිසියම් ආකාරයක සාධන පත්‍රයක් හෝ ලියවිල්ලක් ඇතුළත් වන, යම් පොලි සහිත හෝ වට්ටම් සහිත ණය සාධන පත්‍රයක් වේ.

(ඈ) ණය පුරුකුම්පතකට, කිසියම් ණය, අත්තිකාරම්, අයිරා හෝ වෙනත් ඒ සමාන පහසුකම් හෝ බැංකුවක් විසින් නැතහොත් මූල්‍ය ආයතනයක් විසින් එහි ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ ක්‍රියාවලියේ දී නිකුත් කරන මූල්‍ය සාධන පත්‍රයක් ඇතුළත් නොවිය යුතු ය.

මෙහි (1) වන උපවගන්තියේ "ගෙවීම කරන අවස්ථාවේ දී ගෙවිය යුතු පොලියෙන් අඩුකර ගැනීම" යන්නට, දායකවන්නාගේ හෝ වෙනත්

යම් තැනැත්තකුගේ ගිණුමට බැර කරනු ලබන කවර හෝ පොලී මුදල් ප්‍රමාණයක් ඇතුළත් විය යුතු බව, සැක දුරු කිරීම සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 123 වන වගන්තිය සංශෝධනය කිරීම.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 123 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ "122 වන වගන්තියේ සඳහන් ගෙවීම" යන සියළු වචන හා ඉලක්කම් වෙනුවට, "122 වන වගන්තියේ, 122අ වගන්තියේ හෝ 122 ආ වගන්තියේ සඳහන් පොලිය ගෙවීම" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (අ) වන ඡේදයේ "122 වන වගන්තිය" යන වචන හා ඉලක්කම් වෙනුවට "122 වන වගන්තිය, 122අ වගන්තිය හෝ 122ආ වගන්තිය" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (ආ) ඡේදයේ –

(අ) "123 වන වගන්තිය" යන වචන හා ඉලක්කම් වෙනුවට "122 වන වගන්තිය, 122අ වගන්තිය හෝ 122ආ වගන්තිය" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ආ) එහි " ඔහු හිමිකම් ලැබිය යුතු ය" යන වචන වෙනුවට "ඔහු හිමිකම් ලැබිය යුතු ය": යන වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම, මෙහි පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :

"එසේ වුවද 122අ වගන්තිය හෝ 122ආ වගන්තිය යටතේ බද්ද අඩු කර ගනු ලැබ තිබෙන තක්සේරු වර්ෂ එකකට වැඩි ගණනකින් උපචිත වූ සම්පූර්ණ ආදායම, යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායම ගණනය කිරීමේ දී සම්පූර්ණයෙන් ඇතුළත් කර නොමැති අවස්ථාවක, එසේ බද්ද අඩුකර ගැනීම, ඒ වර්ෂයේ දී හෝ පසුව එළඹෙන තක්සේරු

වර්ෂයක දී හෝ ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමට ඇතුළත් ඉහත සඳහන් පරිදි බදු අඩු කරනු ලැබ තිබෙන ආදායමට ආරෝපණීය වන එසේ අඩුකර ගන්නා ලද අනුපාතික බදු මුදල් ප්‍රමාණයට සීමා කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 123අ සහ 123ආ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

17. මෙහි පහත දැක්වෙන අලුත් වගන්ති, ප්‍රධාන ප්‍රඥප්තියේ 123 වන වගන්තියට ඉක්බිතිව ම ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 123අ සහ 123ආ වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය :—

"ද්විතියික වෙළෙඳපල ගනුදෙනු මත මතිමාත්‍ර බැර කිරීම.

123අ. යම් තක්සේරු වර්ෂයක දී 122අ. වගන්තියේ සඳහන් (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද යම් සුරැකුම්පතක් හෝ භාණ්ඩාගාර බැඳුම්කරයක් හෝ (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල් පත්‍රයක් හෝ (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පතක් හෝ නිකුත් කරන අවස්ථාවේ දී, එම සුරැකුම, බැඳුම්කරය හෝ බිල්පත මත සියයට දහයේ අනුප්‍රමාණය අනුව ආදායම් බදු අඩුකරගනු ලැබූ යම් සුරැකුම්පතක්, භාණ්ඩාගාර බැඳුම්කරයක් හෝ බිල්පත්‍රයක් පිළිබඳ ගනුදෙනු ඇතුළත් යම් ද්විතියික වෙළෙඳපල ගනුදෙනුවල යම් තැනැත්තකු යෙදී සිටින්නා වූ හෝ යම් සුරැකුම්පතක්, බැඳුම්කරයක් හෝ බිල්පත්‍රයක් 2002 අප්‍රේල් 01 වන දිනට පෙර නිකුත් කර ඇත්තා වූ අවස්ථාවක, ඒ පොලී ආදායම ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමෙන් කොටසක් වන්නේ නම්, ඒ ද්විතියික වෙළෙඳපල ගනුදෙනුවේ පොලී ආදයම, එම මුදලින් නවයෙන් එකක් දක්වා දළ කරන ලද ප්‍රමාණයෙන් සියයට දහයක් බැගින් වූ මතිමාත්‍ර බදු බැර කිරීමක් ලබාගැනීමට ඒ තැනැත්තාට හිමිකම ඇත්තේ ය.

මේ වගන්තියේ "ද්විතීයික වෙළෙඳපල ගනුදෙනුවලින් ලැබූ පොලී ආදායම" යන්නෙන්, එවැනි සුරැකුම්පතක්, බැඳුම්කරයක් හෝ බිල්පත්‍රයකින් ආදායම උපයා ඇත්තේ යම් සුරැකුම්පත්, භාණ්ඩාගාර බැඳුම්කර හෝ භාණ්ඩාගාර බිල්පත් ආපසු මිල දී ගැනීමේ ගනුදෙනුවකින් ද එම සුරැකුම්පත, භාණ්ඩාගාර බැඳුම්කරය හෝ භාණ්ඩාගාර බිල්පත්‍රය පිළිබඳ ආපසු මිල දී ගැනීමේ එම ගනුදෙනුවේ දී එම ගනුදෙනුවට අදාළ පොලී වියදම අඩුකිරීමෙන් පසු පොලී ආදායම ලෙස මේ පනතේ 99 වන වගන්තියේ සඳහන් ගණකාධිකාරිවරයකු විසින් සහතික කරන ලද මුදලක් අදහස් වේ.

රඳවා ගැනීමේ බද්දට යටත් පොලී මත ගෙවා ඇති ආදායම් බදු ආපසු ගෙවීම.

123ආ. යම් තැනැත්තකු විසින්, 122අ හෝ 122ආ වගන්ති යටතේ සියයට දහය බැගින් ආදායම් බදු අයකිරීමට යටත් යම් පොලියක් මත දැනටමත් ආදායම් බදු ගෙවා තිබෙන බව, කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වී මාස දොළහක් ඇතුළත, කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත්, එසේ පොලී ආදායම මත ඔහු ගෙවා තිබෙන, 122අ වගන්තිය හෝ 122ආ වගන්තිය යටතේ අඩුකර ගන්නා ලද ආදායම් බදු නොවන, ආදායම් බදු ප්‍රමාණය ආපසු ගෙවනු ලැබීමට ඒ තැනැත්තාට හිමිකම ඇත්තේ ය.".

18. මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය, ප්‍රධාන ප්‍රඥප්තියේ 124 වන වගන්තියට ඉක්බිතිව ම ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 124අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 124අ යන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"122අ හෝ 122ආ වගන්ති යටතේ බදු අඩුකර ගන්නා අවස්ථා පිළිබඳ විධාන නිකුත් කිරීම.

124අ. (1) අවස්ථාවෝචිත පරිදි 122අ හෝ 122ආ යන වගන්තිවල විධිවිධානවලට අනුකූලව යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක පොලී ආදායමෙන් යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින්, ආදායම් බදු අඩුකර ගනු ලබන්නා වූ ද ඒ පොලී ආදායම, යම් තක්සේරු වර්ෂයක් සඳහා

අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තාගේ තක්සේරු කළහැකි ආදායමේ හෝ ඒ හවුල් ව්‍යාපාරයේ බෙදා දිය හැකි ලාභයේ සහ ආදායමේ කොටසක් වන්නා වූ ද අවස්ථාවක, ඒ තැනැත්තා හෝ හවුල්කරුවන්, ඒ තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද, ඒ තක්සේරු වර්ෂය සඳහා 122අ වගන්තිය යටතේ හෝ 122ආ වගන්තිය යටතේ අඩුකර ගත යුතු ආදායම් බදු ප්‍රමාණයට වඩා අඩු වන්නේ නම්, ඒ බැංකුවට හෝ මූල්‍ය ආයතනයට ඒ තක්සේරු වර්ෂයේ ආදායම් බදු අඩුකර ගැනීමෙහි අවශ්‍ය සකස් කිරීම් කරන ලෙස සංස්ථා ණය සුරැකුම්පත් නිකුත් කරනු ලබන සෑම සමාගමකට ඒ බැංකුවට හෝ මූල්‍ය ආයතනයට නියමයක් කරන මෙන් ඉල්ලුම් පත්‍රයක්, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් කොමසාරිස් ජනරාල්වරයා විසින්, නිශ්චිතව නියම කරනු ලැබිය හැකි ආකෘතියකින් හා එසේම නියම කරනු ලැබිය හැකි විස්තර ඇතුළත්ව, කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ හැකි ය.

(2) 124 වන වගන්තියේ (2) වන උපවගන්තියේ, (3) වන උපවගන්තියේ සහ (4) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද යම් විධානයකට හා විධානයක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) එසේ වුවද ආදායම් බදු එසේ වැඩියෙන් අයකර ගැනීම උද්ගත වන්නේ, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් දරන ලද, 29 වන වගන්තිය යටතේ අඩුකිරීම් සිදු කළහැකි අලාභවල ප්‍රතිඵලයක් වශයෙන් නම් සහ අදාළ තක්සේරු වර්ෂයේ ආරම්භයේ දී එම අලාභවල ප්‍රමාණය පෙර වර්ෂයේ පදනම මත ඇස්තමේන්තු කළ ආදායම් බදු අඩු කිරීමට යටත් වූ පොලී ආදායම හෝ 122අ වන වගන්තිය හෝ 122ආ වන වගන්තිය යටතේ ආදායම් බදු අඩු කිරීමට යටත් වූ පොලී ආදායම හෝ ආදායම් බද්දෙන් නිදහස් කර ඇති ප්‍රමාණය, අදළ වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන මුළු ව්‍යවස්ථාපිත ආදායම, ඉක්මවන්නේ නම් මිස,

මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන පරිදි කොමසාරිස් ජනරාල්වරයා විසින් විධානයක් නිකුත් නොකළ යුතු ය.".

19. මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය, ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තියට ඉක්බිතිව ම ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 125අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියෙහි 125අ යන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"බදු ගෙවීම මගහැරීම සම්බන්ධ දණ්ඩන.

125අ. යම් ණය සුරැකුමක් නිකුත් කරන යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින් හෝ ස්ථාපිත බදු ණයකර නිකුත් කරන යම් සමාගමක් විසින් අවස්ථාවෝචිත පරිදි, 122අ හෝ 122ආ වගන්තියේ විධිවිධානවලට අනුකූලව බදු අඩු කර නොගන්නා බව කොමසාරිස් ජනරාල්වරයාගේ අදහස වන අවස්ථාවක ඒ පිළිබඳ හේතු දැක්වීමට ණය සුරැකුම් නිකුත් කරන ඒ බැංකුවට, මූල්‍ය ආයතනයට හෝ සමාගමකට අවස්ථාවක් දීමෙන් පසුව සහ අවස්ථාවෝචිත පරිදි 122අ හෝ 122ආ වගන්තියේ විධිවිධාන උල්ලංඝනයක් සිදු වී තිබෙන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, ණය සුරැකුම්පත් නිකුත් කරන එවැනි සමාගමකට බැංකුවකට හෝ මූල්‍ය ආයතනයකට එකී වගන්තිවල විධිවිධාන උල්ලංඝනය කිරීමෙන් මගහැරෙන ලද ආදායම් බද්ද මෙන් පන්සිය ගුණයකට සමාන මුදල් ප්‍රමාණයක දණ්ඩනයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය යුතු ය.".

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියට (1) වන උපවගන්තිය ලෙස අංක යෙදීමෙන් : සහ

(2) නැවත අංක යෙදූ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(2) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් ව තිබුණ ද (1) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු දණ්ඩන මුදලක්, 2002 නොවැම්බර් මස 6 වන දින වන විට නොගෙවා ඉතිරිව තිබෙන අවස්ථාවක-

(අ) ගෙවීම පැහැර හැර තිබෙන බදු මුදල 2002 නොවැම්බර් මස 6 වන දින හෝ ඊට පෙර සම්පූර්ණයෙන් ගෙවා නිමකර ඇත්නම්, එම දණ්ඩන මුදල සම්පූර්ණයෙන් අතහැර දැමිය යුතු ය :

(ආ) ගෙවීම පැහැර හැර තිබෙන බදු මුදලින් කොටසක් 2002 නොවැම්බර් මස 6 වන දින දී හෝ ඊට ප්‍රථම ගෙවා ඇත්නම්, එසේ ගෙවන ලද පැහැර හැරි බදු මුදල් ප්‍රමාණයට සාපේක්ෂව යොමු කළ හැකි දණ්ඩන මුදල් ප්‍රමාණය අතහැර දැමිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 130අ සහ 130ආ යන අලුත් වගන්ති ඇතුලත් කිරීම.

21. පහත දැක්වෙන අලුත් වගන්ති, ප්‍රධාන ප්‍රඥප්තියේ 130 වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුලත් කරනු ලබන අතර, ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 130අ සහ 130ආ වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය :-

"ආදායම් බදු අය කරනු ලැබිය හැකි තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය.

130අ. 122අ වගන්තියේ හෝ 122ආ වගන්තියේ විධිවිධානවලට අනුකූලව යම් තැනැත්තකුගෙන් හෝ හවුල් ව්‍යාපාරයකින් යම් බද්දක් අයකරගනු ලැබ තිබෙන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය, ආදායම් බදු අයකරනු ලැබිය හැකි තැනැත්තෙක් හෝ හවුල් ව්‍යාපාරයක් වන්නේ ය.

ලියාපදිංචි සමුපකාර සමිති සමාගම් ලෙස සලකන බව.

130ආ. ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කර තිබෙන කවර හෝ සමුපකාර සමිතියක්, මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා සමාගමක් ලෙස සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 186 වන වගන්තිය සංශෝධනය කිරීම.

22. 2002 අංක 10 දරන පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 186 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) "බලයලත් නියෝජිතයා" යන යෙදුමේ අර්ථකථනයේ-

(අ) 1(අ) අයිතමයේ (iii) වන උප අයිතමයේ "නීතිඥවරයකු වන්නා වූ ද," යන වචන වෙනුවට "නීතිඥවරයකු"; යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) 1(අ) අයිතමයේ (iv) වන උප අයිතමයේ "සේවා නියුක්තියකු වන්නා වූ ද :" යන වචන වෙනුවට "සේවා නියුක්තියකු :" යන වචන ආදේශ කිරීමෙන් :

(ඇ) 1(අ) අයිතමයේ (iv) වන උප අයිතමයට ඉක්බිතිව ම, පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :-

"(v) 2000 අංක 21 දරන ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතනයේ සාමාජිකයකු";

(2) "නියමිත" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

"ප්‍රාථමික අලෙවිකරු" යන්නෙන්, ශ්‍රී ලංකා මුදල් මණ්ඩලය විසින් (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත ආඥාපනත යටතේ හෝ (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ හෝ (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ හෝ පත්කරන ලදුව, භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, ලියාපදිංචි ස්කන්ධ හෝ වෙනත් සුරැකුම්පත් සඳහා ප්‍රාථමික අලෙවිකරුවකු ලෙස ක්‍රියා කරන, මූල්‍ය සම්පාදකයකු හෝ බැංකුවක් අදහස් වේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කිරීම.

23. ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය, එහි (12) වන අයිතමයේ "23 (1) (ඩ)" යන අකුර හා ඉලක්කම් වෙනුවට "23 (1) (ට)" යන අකුර හා ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අතීතයට බලපෑම.

24. (1) මේ පනතේ 2, 3, 4, 5, 9(1), (ආ), (ඇ), 9(2), 9(3), 10, 13, 14, 16, සහ 22 වන වගන්තිවලින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10, 15, 21අ, 21ආ, 23, 29, 40ආ, 122, 122අ, 123, සහ 186 වගන්තිවලට කරන ලද සංශෝධන, සියලු කාර්ය සඳහා, 2002 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සැලකිය යුතු ය.

(2) මේ පනතේ 6 වන වගන්තියෙන්, ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කරන ලද 21ඇ, 21ඉ සහ 21ඊ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම සියලු කාර්ය සඳහා 2003 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස, සැලකිය යුතු ය.

(3) මේ පනතේ 7(2), 8 සහ 23 වන වගන්තිවලින් ප්‍රධාන ප්‍රඥප්තියේ 23, 24 යන වගන්තිවලට සහ තුන්වන උපලේඛනයට කරන ලද සංශෝධන, සියලු කාර්ය සඳහා 2000 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සැලකිය යුතු ය.

(4) (අ) මේ පනතේ 9(1) (අ) වන වගන්තියෙන්, ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියට කරන ලද සංශෝධනය; සහ

(ආ) මේ පනතේ 15 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුලත් කරන ලද 122ආ යන අලුත් වගන්තිය,

සියලු කාර්ය සඳහා 2002 නොවැම්බර් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස, සැලකිය යුතු ය.

(5) මේ පනතේ 11 සහ 12 වන වගන්තිවලින් ප්‍රධාන ප්‍රඥප්තියේ 49 සහ 50 වන වගන්තිවලට කරන ලද සංශෝධන සියලු කාර්ය සඳහා 2003 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සැලකිය යුතු ය.

(6) මේ පනතේ 20 වන වගන්තියෙන්, ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තියට කරන ලද සංශෝධනය සියලු කාර්ය සඳහා 2002 නොවැම්බර් මස 6 වන දින සිට බලාත්මක වූ ලෙස, සැලකිය යුතු ය.

(7) මේ පනතේ-

(අ) 6 වන වගන්තියෙන්, ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුලත් කරන ලද 21ඊ යන අලුත් වගන්තිය සියලු කාර්ය සඳහා 2002 ඔක්තෝබර් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සැලකිය යුතු ය.

(ආ) 6, 17, 18, 19 සහ 21 වන වගන්තිවලින් ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුලත් කරන ලද 21ඇ, 123අ, 123ආ, 124අ, 125අ, 130අ සහ 130ආ යන අළුත් වගන්ති සියලු කාර්ය සඳහා 2002 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සැලකිය යුතු ය.".

අනනුකූලතාවක් ඇතිවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

25. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන ටක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.